උක් පර්යේෂණ ආයතනය
கரும்பு ஆராய்ச்சி நிலையம்
Sugarcane Research Institute

2011

වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
Annual Report

උක් පර්යේෂණ ආයතනය

ප්‍රධාන මධ්‍යස්ථානය - උඩවලව

දුරකථනඃ +94472233281, +94472233285

ෆැක්ස්ඃ +94472233233

ඊ මේල්: info@sugarres.lk

වෙබ් අඩවියඃ www.sugarres.lk

උප කාර්යාලය

තෙලවල පාර, රත්මලාන

දුරකථනඃ +94112605759

ෆැක්ස්ඃ +94112605236

සභාපති

දුරකථනඃ +94112607161

ෆැක්ස්ඃ +94112605145

අධ්‍යක්ෂ හා ප්‍රධාන විධායක

දුරකථනඃ +94472233282

ගරු සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යතුමා,
සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය
ගොවිජන මන්දිරය
80/5, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ගරු ඇමතිතුමනි,

2011. 01. 01 දින සිට 2011. 12. 31 දක්වා කාලය සඳහා
උක් පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව

2011. 01. 01 දින සිට 2011. 12. 31 දින දක්වා වූ වර්ෂය සඳහා උක් පර්යේෂණ ආයතනයේ ප්‍රගතිය ද එම මුදල් වර්ෂය වෙනුවෙන් වූ අවසන් ගිණුම් හා විගණකාධිපතිගේ වාර්තාව හා ඊට පිළිතුරු ද අඩංගු ඉහත වාර්ෂික වාර්තාව මේ සමග සතුටින් ඉදිරිපත් කරමි.

මෙයට- විශ්වාසී

එස්. කේ. සිරිල්
සභාපති
උක් පර්යේෂණ ආයතනීය පාලක මණ්ඩලය

30 ඔක්තෝම්බර් 2012

පටුන

පිටුව

දැක්ම	1
මෙහෙවර	1
පාලක මණ්ඩලය	2
සභාපතිගේ සමාලෝචනය	3
අධ්‍යක්ෂකගේ වාර්තාව	4
ආංශික වාර්තා	6
බෝග වැඩි දියුණු කිරීමේ අංශය	6
බෝග සහ සම්පත් කළමනාකරණ අංශය	8
බෝග පෝෂණ අංශය	10
බෝග ආරක්ෂණ අංශය	11
යාන්ත්‍රීකරණ තාක්ෂණ අංශය	12
සැකසුම් තාක්ෂණ අංශය	13
ආර්ථික විද්‍යා, ජීවමිතික සහ තොරතුරු තාක්ෂණ අංශය	13
තාක්ෂණ හුවමාරු සහ සංවර්ධන අංශය	14
පරිපාලන හා මුදල් අංශය	18
ප්‍රකාශන	22
විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව	23
විගණනය කළ මූල්‍ය ප්‍රකාශන	24
මූල්‍යම තත්ත්ව ප්‍රකාශනය	24
මූල්‍යම කාර්යසාධන ප්‍රකාශනය	25
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	26
මූල්‍යම තත්ත්ව ප්‍රකාශනයට අදාළ සටහන්	27
මූල්‍යමය කාර්යසාධන ප්‍රකාශනයට අදාළ සටහන්	32
උපලේඛන අංක 1: දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ	35
විගණකාධිපති වාර්තාව	36
විගණකාධිපති වාර්තාවට පිළිතුරු	43
වර්ෂ 2006 සිට 2010 දක්වා සුවිශේෂ මූල්‍ය තොරතුරු	48

දැක්ම

උක් තාක්ෂණය පිළිබඳ විශිෂ්ටතම ආයතනය සහ
ශ්‍රී ලංකාවේ උක් කර්මාන්තය සංවර්ධනය කිරීමේ ප්‍රමුඛයා බවට පත්වීම

මෙහෙවර

රටට ඔබින නව තාක්ෂණයන් දියුණු කිරීම සහ ඒවා ලබාදීම තුළින්
ශ්‍රී ලංකාවේ උක් කර්මාන්තයෙහි තරඟකාරී බව ඉහළ නැංවීම සහ
එය තිරසාර ලෙස ව්‍යාප්ත කිරීම සහ සංවර්ධනය කිරීමට දායක වීම.

පාලක මණ්ඩලය

එස්. කේ. සිරිල් මයා	සභාපති	පත්කළ සාමාජික
ටී. එල්. ටී. ඒ. සුනිල් ද සිල්වා මහතා	සාමාජික	පත්කළ සාමාජික (2011 ජුනි 14 සිට)
පී. ආර්. එල්. යූ. එල්. පී. විජේවර්ණසූරිය මහතා	සාමාජික	පත්කළ සාමාජික (2011 ජුනි 04 සිට)
හසිත ගුණවර්ධන මහතා	සාමාජික	පත්කළ සාමාජික (2011 මැයි 06 සිට)
චාමිකා මධුවන්ති මෙනවිය	සාමාජික	මුදල් අමාත්‍යාංශය නියෝජනය සඳහා නම් කළ සාමාජික (2011 ජනවාරි 31 සිට)
ආර්. එම්. සී. එම්. හේරත් මිය	සාමාජික	සුළු අපනයන බෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය වෙනුවෙන් නම් කළ සාමාජික (2011 ජනවාරි 25 සිට)
ආචාර්ය එන්. සී. කුමාරසිංහ මහතා	සාමාජික	අධ්‍යක්ෂ

සභාපතිගේ සමාලෝචනය

2011- 2015 සංයුක්ත සැලැස්මට අනුව පර්යේෂණ සහ සංවර්ධන සහ මිනිස් බල සහ යටිතල පහසුකම් සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

උක් පර්යේෂණ ආයතන පනත සංශෝධනය කරමින් ආයතනයේ බලතල පර්යේෂණවලට අමතරව උක් කර්මාන්තයේ සංවර්ධන සහ නියාමන කාර්යයන් ඉටු කිරීමට හැකිවන පරිදි අවශ්‍ය යෝජනා ඇතුළත් කරන ලදී.

සීනි කර්මාන්තයේ අවශ්‍යතාවයන්ට අනුව පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් වඩා ප්‍රතිඵලදායක ලෙස ඉටුකිරීමේ අරමුණින් ආයතනයෙහි තාක්‍ෂණික අංශ ප්‍රතිව්‍යුහගත කරන ලදී. ඒ අනුව තාක්‍ෂණික අංශ, බෝග වැඩිදියුණු කිරීමේ අංශය, බෝග සහ සම්පත් කළමනාකරණ අංශය, බෝග පෝෂණ අංශය, බෝග ආරක්‍ෂණ අංශය, යාන්ත්‍රීකරණ තාක්‍ෂණ අංශය, සැකසුම් තාක්‍ෂණ අංශය, ආර්ථික විද්‍යා, ජීවමිතික සහ තොරතුරු තාක්‍ෂණ අංශය සහ තාක්‍ෂණ හුවමාරු සහ සංවර්ධන අංශය ලෙස ප්‍රතිව්‍යුහගත කරන ලදී. පර්යේෂණ අංශ සඳහා වඩා ප්‍රතිඵලදායී සේවාවක් සැපයීම සඳහා පර්යේෂණ ගොවිපල, බෝග සහ සම්පත් කළමනාකරණ අංශය යටතට පත් කරන ලදී.

එමෙන් ම පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් ලංකාවේ සීනි කර්මාන්තයෙහි අවශ්‍යතාවයන්ට අනුව වඩා ප්‍රතිඵලදායක ලෙස ඉටුකිරීම සඳහා පහත දැක්වෙන ප්‍රධාන වැඩ සටහන් 7 යටතේ ක්‍රියාත්මක කරන ලදී.

- අ. බෝග වැඩි දියුණු කිරීම
- ආ. බෝග සහ සම්පත් කළමනාකරණය
- ඇ. බෝග පෝෂණය
- ඈ. බෝග ආරක්‍ෂණය
- ඉ. ගොවිපළ යාන්ත්‍රීකරණය
- ඊ. සැකසීම සහ නිෂ්පාදන දියුණු කිරීම
- උ. තාක්‍ෂණ හුවමාරුව සහ සංවර්ධනය

මිනිස් බල පුහුණු අවශ්‍යතා හඳුනාගත් නමුත් විද්‍යාත්මක නිලධාරීන්හට දිගුකාලීන පුහුණුව සඳහා යොමු කිරීමට සුදුසු ස්ථානයන් සොයා ගැනීමට නොහැකි විය. නමුත් කාර්ය මණ්ඩලය සඳහා දේශීය සහ විදේශීය කෙටි කාලීන පුහුණු වැඩසටහන් රාශියකට සහභාගිවීමට අවස්ථාව ලබාදීමට හැකිවිය.

යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සතුටුදායක ලෙස සිදු කිරීමට නොහැකි විය. ඊට හේතු වූයේ ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට ප්‍රමාද වීමයි. නමුත් එන්සල්වත්තේ පිහිටි අභිජනන මධ්‍යස්ථානය සහ නිර්දේශිත උක් ප්‍රභේද ගණනය කර බීජ උක් නිපදවීම සඳහා අත්තිවාරම් බීජ උක් තවානක් උඩවලවේ ස්ථාපනය කිරීමට හැකිවිය.

ඊට අමතරව ලංකාවේ සීනි කර්මාන්තය දියුණු කිරීමට දායක වීම සඳහා බදුල්ල සහ කිලිනොච්චි දිස්ත්‍රික්කයන්හි වැඩසටහන බැගින් ක්‍රියාත්මක කරන ලදී. එම වැඩ සටහන් දෙකෙහි අරමුණු වූයේ ග්‍රාමීය මට්ටමෙහි උක් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත දියුණු කිරීමයි.

එස්. කේ. සිරිල්
සභාපති
උක් පර්යේෂණ ආයතනය

අධ්‍යක්ෂකගේ වාර්තාව

1981 අංක 75 දරණ උක් පර්යේෂණ ආයතන පනත මගින් 1984 දී ස්ථාපනය කරන ලද උක් පර්යේෂණ ආයතනය අවුරුදු 27ක කාලයක් පර්යේෂණ සහ ව්‍යාප්ති කටයුතුවලින් සීනි කර්මාන්තය දියුණු කිරීම සඳහා අවශ්‍ය දායකත්වය ලබාදෙන ලදී. සීනි කර්මාන්තය සංවර්ධනය සඳහා වඩා හොඳ දායකත්වයක් ලබාදීමේ අරමුණින් මෙම වර්ෂය ආරම්භයේ දී පර්යේෂණ ක්ෂේත්‍රයන් අනුව තාක්ෂණික අංශ ප්‍රතිව්‍යුහගත කරන ලදී.

මෙම වසරෙහි වඩාත් කැපී පෙනුන ජයග්‍රහණයක් වන්නේ, එස්. එල්. 95 4033, එස්. එල්. 95 4430 සහ එස්. එල්. 96 328 යන නව උසස් උක් ප්‍රභේද 03ක් වාණිජ වගාව සඳහා නිකුත් කිරීමට හැකි වීමයි. සෙවනගල සහ අම්පාර දිස්ත්‍රික්කයේ දමන ප්‍රදේශයේ ක්ෂේත්‍ර ආදර්ශන තුළින් එස්. එල්. 83 06, එස්. එල්. අයි. 121, එස්. එල්. 92 4918, එස්. එල්. 92 4993 සහ එස්. එල්. 92 5588 යන උක් ප්‍රභේද ප්‍රචලිත කිරීම සඳහා කටයුතු කරන ලදී.

එස්. එල්. 88 116 සහ එස්. එල්. 96 328 යන ප්‍රභේදයන්හි ප්‍රාථමික තවාන් ස්ථාපනය කිරීම සඳහා එම ප්‍රභේදවලින් බීජ උක් සෙවනගල සීනි සමාගම වෙත ලබාදෙන ලදී. ඒ සමගම එස්. එල්. 84 1673, එස්. එල්. 92 4918, එස්. එල්. 92 4997, එස්. එල්. 92 5581, එස්. එල්. 95 4033, එස්. එල්. 95 4430 සහ එස්. එල්. 96 328 යන උක් ප්‍රභේදයන් පිළිබඳ තොරතුරු උක් වගාකරුවන් වෙත ලබා දෙන ලදී. උක් පර්යේෂණ ආයතනය විසින් නිපදවන ලද එස්. එල්. 83 06, එස්. එල්. 89 1673 සහ එස්. එල්. 92 5581 යන උක් ප්‍රභේද වියට්නාමයෙහි ROC 23, VN 84 4137 සහ QD 93 159 යන ප්‍රභේද තුන සමග හුවමාරු කර ගන්නා ලදී.

වාරිපෝෂිත සහ අතිරේක ජල සැපයුම් තත්ත්ව යටතේ වැඩි නිරි අස්වනු ලබාදෙන එස්. එල්. 90 6237 සහ එස්. එල්. 93 945 යන ප්‍රභේද සහ අතිරේක ජල සැපයුම් තත්ත්ව යටතේ වැඩි නිරි අස්වැන්නක් ලබාදෙන එස්. එල්. 92 4918 යන ප්‍රභේද පිළිබඳ තොරතුරු සීනි කර්මාන්තය වෙත ලබාදෙන ලදී. සෙවනගල ප්‍රදේශයේ වසර 2000 සිට 2010 දක්වා උක් වගා කිරීම සඳහා වියදම් සහ එහි ආදායම් විශ්ලේෂණය කරන ලදී. බදුල්ල සහ මොණරාගල දිස්ත්‍රික්කයන්හි උක් හකුරු නිෂ්පාදනයේ වියදම් සහ ආදායම් විශ්ලේෂණය සිදු කරන ලදී. හිඟුරාණ ප්‍රදේශයේ උක් ඉඩම් වගා සඳහා පොහොර නිර්දේශය සංශෝධනය කර ලබාදෙන ලදී.

යාන්ත්‍රීකරණ තාක්ෂණ අංශය විසින් කොකු නගුල් 20 ක් සහ ඇලි සාදන උපකරණ 05ක් නිපදවන ලද අතර, ඉන් 04ක් පැල්වත්තේ ගොවි සංවිධාන වෙත සහනදායී මිලකට ලබාදෙන ලදී. උක් පර්යේෂණ ආයතනය මගින් නිපදවූ ඉහත උපකරණ දෙක බුත්තල, සියඹලාණ්ඩුව සහ හිඟුරාණ ප්‍රදේශයන්හි ක්ෂේත්‍ර ආදර්ශන සහ පුහුණු වැඩසටහනක් පැවැත්වීම මගින් ඒවායේ භාවිතය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරන ලදී. එමෙන්ම රෝද දෙකේ ට්‍රැක්ටරයක් මගින් ක්‍රියාකළ හැකි පොහොර යොදන උපකරණය සහ ඉන්දියන් මාදිලියේ උක් අංකුර කැපීමේ උපකරණය නිපදවීම ද මෙම වසරේ කැපී පෙනෙන නව සොයා ගැනීම් වේ. ඒ හැරුණු විට පිපිඤ්ඤා, රටකජු, කව්පි, කොමඩු සහ මිරිස් අතුරු බෝගයන් ලෙස වගා කිරීම ප්‍රවර්ධනය කිරීම, පාංශු සාරවත් බව කළමනාකරණය කිරීම සහ පරතරයක් ඇතිව උක් සිටුවීමේ ක්‍රමය ප්‍රචලිත කිරීම සඳහා ව්‍යාප්ති වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. සෙවනගල සහ පැල්වත්ත ප්‍රදේශයේ වූල් කුඩිත්තා ආසාදිත වගාවන් වෙත රසායනාගාර තුළ ඇති කළ ඩයිෆා ඇපිඩිවෝරා සහ මයික්‍රොමස් විශේෂ මුදා හැරීම තුළින් එම පලිබෝධකයාගේ ගුණනය පාලනය කරන ලදී.

පර්යේෂණ සහ ව්‍යාප්ති වැඩසටහන්වලට අමතරව මෙම වසර තුළදී ආයතනය සංවර්ධන වැඩසටහන් රාශියක නිරත විය. වසා ඇති කන්තලේ සීනි කර්මාන්තය සහ නව උක් වගා ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා රජය මෙන්ම ආයෝජකයින් වෙත ද අවශ්‍ය උපදෙස් සහ තොරතුරු ලබාදෙන ලදී. වාණිජ වගා කිරීම සඳහා උක් ප්‍රභේද 24කින් යුත් තවානක්

කන්තලෙහි ආරම්භ කරන ලදී. ගල්ඔය වැවිලි සමාගමට අවශ්‍ය සහයෝගය ලබාදෙන ලද අතර බිබිල සීනි ව්‍යාපෘති පිළිබඳ අදහස් කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා අමාත්‍ය මණ්ඩලය වෙත ලබාදෙන ලදී.

කිලිනොච්චි දිස්ත්‍රික්කයෙහි 2013 වන විට උක් ගොවි පවුල් 50ක් ඇති කිරීමේ අරමුණින් මූලික පියවර ලෙස බීජ උක් නිෂ්පාදනය කිරීම සඳහා ප්‍රාදේශීය කෘෂිකර්ම, පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයෙහි බීජ උක් තවානක් ස්ථාපනය කරන ලදී. කිලිනොච්චි දිස්ත්‍රික්කයෙහි තෝරාගත් ගොවි මහතුන් සහ නිලධාරීන්හට උක් වගා කිරීම සහ හකුරු නිෂ්පාදනය පිළිබඳ පුහුණුවක් ද ලබාදෙන ලදී.

උක් හකුරු නිෂ්පාදනය දියුණු කිරීම ද 2011 වසරේ දී ප්‍රමුඛතම ක්ෂේත්‍රයකි. කාර්මික සංවර්ධන මණ්ඩලය සමග එක්ව පුහුණු වැඩසටහන් පැවැත්වීම, අවධානය යොමු කළ ප්‍රාදේශීය බැංකු හරහා උක් මෝල් නවීකරණය සඳහා ණය ලබාදීමට කටයුතු කිරීම සියඹලාණ්ඩුව ප්‍රදේශයේ හකුරු කර්මාන්තය දියුණු කිරීම සඳහා සිදුකළ වැඩ කටයුතු අතර ප්‍රධාන වේ. සියඹලාණ්ඩුවෙහි සිවිල් ආරක්ෂක බලකාය සහ වැලිකන්ද කන්දකාඩු පුනරුත්ථාපන කඳවුරෙහි නිලධාරීන් සඳහා උක් වගා කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදෙන ලදී.

එම වර්ෂය තුළ දී උක් පර්යේෂණ ආයතනය ප්‍රාදේශීය ආයතන සමඟ සම්බන්ධතා ඇති කර පවත්වාගෙන යන ලදී. ආයතනයේ අධ්‍යක්ෂ වියට්නාමයෙහි ශාක ආරක්ෂක පර්යේෂණ ආයතනයෙන් ලද ආරාධනයකට අනුව උක් තෘණාකාර කුරුවීමේ රෝගය පාලනය කිරීම පිළිබඳ උපදෙස් ලබාදීම සඳහා එහි සංචාරයක නිරත විය. පකිස්තානයෙහි උක් අභිජනන මධ්‍යස්ථානය වෙත ලංකාවේ සිදුකළ මුහුම් 100ක බීජ ලබාදෙන ලදී. 2011 වසරේ දී ඉන්දියාවේ නවදිල්ලි නුවර පැවති හතරවන අන්තර්ජාතික සීනි සම්මේලනය සඳහා එස්. කේ. සිරිල් (සභාපති), ආචාර්ය එන්. සී. කුමාරසිංහ (අධ්‍යක්ෂ) සහ ආචාර්ය ඩබ්ලිව්. ආර්. ජී. විතාරම (බෝග සහ සම්පත් කළමනාකරණ අංශයෙහි ප්‍රධාන පර්යේෂණ නිලධාරී) යන මහත්වරුන් සහභාගි වී දැනුම හුවමාරු කර ගන්නා ලදී.

2011 වසරේ දී ආයතනයේ සෙස් බදු ලෙස රු. මිලියන 144ක් එකතු කර ගන්නා ලද අතර එය ඊට පෙර වසරට වඩා 0.8% වැඩි වීමකි. නමුත් අතිරික්ත අරමුදල් ලෙස පැවති රුපියල් මිලියන 68ක් මහා භාණ්ඩාගාරය වෙත ලබාදීමට සිදුවිය. මෙම වසර තුළදී ආයතනයට නව යටිතල පහසුකම් එකතු නොවීය.

ආචාර්ය එන්. සී. කුමාරසිංහ

අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක

උක් පර්යේෂණ ආයතනය

ආංශික වාර්තා

බෝග වැඩිදියුණු කිරීමේ අංශය

කාර්ය මණ්ඩලය

ඒ. විජේසූරිය මයා (කෘෂිකර්ම විද්‍යාවේදී, දර්ශනපති)	ප්‍රධාන පර්යේෂණ නිලධාරි සහ අංශ ප්‍රධානි
ඒ. එම්. එම්. එස්. පෙරේරා මිය (විද්‍යාවේදී)	පර්යේෂණ නිලධාරි
ඩී. මානෙල් මිය (කෘෂිකර්ම විද්‍යාවේදී, විද්‍යාපති)	පර්යේෂණ නිලධාරි
ඒ. එල්. සී. කුමාරි මිය	තාක්ෂණ නිලධාරි
ඩී. වීරසිංහ මයා	තාක්ෂණ නිලධාරි
එල්. ඩී. ඩී. පී. ගුණරත්න මිය (කෘෂිකර්ම ඩිප්ලෝමා)	තාක්ෂණ නිලධාරි
ඩබ්. ජී. එම්. ජේ. පෙරේරා මයා	රසායනාගාර/ක්ෂේත්‍ර උපස්ථායක
එස්. එච්. කරුණාරත්න මයා	රසායනාගාර/ක්ෂේත්‍ර උපස්ථායක

පර්යේෂණ විශේෂ අවස්ථා

- වාණිජ මුහුම් සියයකින් ලබාගත් උක් බීජ පකිස්තානයට සැපයීම.
- SL 83 06, SL 89 1673, SL 92 5588 යන ප්‍රභේද 03 වියට්නාමයට ලබාදීම.
- ROC 23, VN 84 4137 සහ QD 93 159 යන ප්‍රභේද වියට්නාමයෙන් ලබාගැනීම.
- SL 99 අභිජනන පෙළෙහි ප්‍රභේද 05ක් හා SL 98 අභිජනන පෙළෙහි ප්‍රභේද 24ක් දේශීය උක් ජාන ප්ලාස්මයට එක් කිරීම.
- උක් ජාන ප්ලාස්මයෙහි උක් වර්ග 1243ක් එන්සල්වත්ත මුහුම් උප මධ්‍යස්ථානයෙහි සංරක්ෂණය කිරීම.
- දේශීයව රැස්කරගත් උක් ප්‍රභේද 217 න් 44ක අභිජනන අගය ඇගයීම.
- ක්ෂේත්‍ර ලන්තෑරුම් හා සංරක්ෂිත ද්‍රාවණ ක්‍රම උපයෝගී කරගනිමින් මුහුම් 1301ක් එන්සල්වත්ත උක් අභිජනන උප මධ්‍යස්ථානයේදී සිදු කිරීම.
- *S. spontaneum* ප්‍රභේද පීතෘ ශාකය ලෙසද වාණිජ උක් ප්‍රභේද හා *S. officinarum* ප්‍රභේද මාතෘ ශාක ලෙසද ගනිමින් අන්තර් විශේෂ මුහුම් 38ක් ද *Erianthus arundinaceus* ප්‍රභේද පීතෘ ශාකය ලෙස යොදා ගනිමින් අන්තර්ගත මුහුම් 21ක් ද සිදුකිරීම.
- SL 95 4033, SL 95 4430 සහ SL 96 328 යන උක් ප්‍රභේද තුන වාණිජ වගාව සඳහා නිර්දේශ කර නිකුත් කිරීම.

ඉහළ උක් හා සීනි අස්වැන්නක් ලබාදෙන SL 96 328 නව උක් ප්‍රභේදය

- SL 2000 අභිජනන පෙළෙහි උක් ප්‍රභේද 24ක් උඩවලව, හිඟුරාන හා පැල්වත්ත ප්‍රදේශයන්හිදී ඇගයීමට ලක් කිරීම.
- හිඟුරාන සහ මඩුල්ල යන ප්‍රදේශයන් සඳහා උක් ප්‍රභේදවල අනුවර්ථිතාව ඇගයීමට ලක් කිරීම.
- බහු අදියර ප්‍රභේද වරණ ක්‍රියාවලිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම.
- කිණක රෝපණය මගින් ප්‍රවේනික විචලතාවයකින් යුතු උක් පැළ 3158ක් නිපදවීම.
- SL 71 30, SL 83 06, SL 88 116 හා M/438/59 යන උක් ප්‍රභේදවලින් නිපදවූ රෝගවලින් තොර පැළ 950ක් බෝග සහ සම්පත් කළමනාකරණ අංශය මගින් කිලිනොච්චියෙහි උක් වගා ප්‍රවර්ධන වැඩසටහන සඳහා ලබාදීම.
- රෝගවලින් තොර බීජ තවාන් ස්ථාපනය සඳහා වාණිජ හා වාණිජ වගාවට නිදහස් කිරීමට ආසන්න උක් ප්‍රභේදවලින් ලබාගත් ලෙඩ රෝගවලින් තොර පැළ 4000ක් හිඟුරානෙහි ගල්ඔය වැවිලි සමාගම වෙත ලබාදීම.
- 2011 වසරේ දී වාණිජ වගාව සඳහා නිදහස් කළ ප්‍රභේද අග්‍රස්ථ අංකුර විභාජනයට ලක් කොට ලබාගත් බීජ උක් ප්‍රභේද ප්‍රචලිත කිරීමේ ක්‍රියාවලියට ලබාදීම.
- SL 83 06, SL 88 116 හා CO 775 යන ප්‍රභේදයන්හි අග්‍රස්ථ අංකුර ප්‍රරෝහනයට අදාළ ප්‍රශස්ත ශාක හෝමෝන සාන්ද්‍රණ නිර්ණය කරන ලදී.
- ME, GDH, MDH සහ PEROXYDASE යන එන්සයිම භාවිතයෙන් ජාන ප්ලාස්ම වර්ග 44ක් අණුක විද්‍යාත්මක වර්ගීකරණයට ලක් කිරීම.
- කන්තලේ ප්‍රදේශයට සුදුසු ප්‍රභේද තෝරා ගැනීම සඳහා පර්යේෂණ වගා ස්ථාපනය සඳහා අවශ්‍ය බීජ උක් ලබාගැනීම සඳහා වාණිජ හා වාණිජ වගාවට නිකුත් කිරීමට ආසන්න ප්‍රභේද 24ක් බීජ ගුණන කිරීමේ වගාවන් ස්ථාපනය කිරීම.

සංවර්ධන

අත්තිවාරම් බීජ උක් නිෂ්පාදනය

වාණිජ වගාව සඳහා නිර්දේශිත ප්‍රභේද 06ක් වන SL 83 06, SLI 121, SL 95 4033, SL 95 4430, SL 96 328 සහ CO 775 සහ වාණිජ වගාවට නිකුත් කිරීමට ආසන්න ප්‍රභේදය වන SL 96 128 යන ප්‍රභේදයන්ගෙන් යුක්ත හෙක්ටයාර 02 ක් පමණ වූ බීජ උක් තවානක් උඩවලවේදී ස්ථාපනය කිරීම.

අත්තිවාරම් බීජ උක් තවාන

බෝග සහ සම්පත් කළමනාකරණ අංශය

කාර්ය මණ්ඩලය

ආචාර්ය ඩබ්ලිව්. ආර්. ජී. විතාරම මයා (කෘෂිකර්ම විද්‍යාවේදී, දර්ශනපති, දර්ශනශූරි)	ප්‍රධාන පර්යේෂණ නිලධාරි සහ අංශ ප්‍රධානි
ඒ. එල්. සී. ද සිල්වා මයා (කෘෂිකර්ම විද්‍යාවේදී, දර්ශනපති)	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි
එල්. එම්. ජේ. ආර්. විජේවර්ධන මයා (කෘෂිකර්ම විද්‍යාවේදී)	පර්යේෂණ නිලධාරි
කේ. ඒ. ආරියරත්න මයා	ගොවිපල අධිකාරි
ඩබ්ලිව්. ජී. නිමල් මයා	තාක්ෂණ නිලධාරි
බී. පී. ජී. එස්. සඳනායක මයා (කෘෂිකර්ම ඩිප්ලෝමා)	තාක්ෂණ නිලධාරි
ඩබ්. ඒ. යූ. ප්‍රියන්ත මයා	තාක්ෂණ නිලධාරි
එම්. එස්. එන්. විජේසිරි මයා	රසායනාගාර/ ගොවිපළ උපස්ථායක

පර්යේෂණ විශේෂ අවස්ථා

- වර්ෂාපෝෂිත හා අතිරේක ජල සම්පාදිත යන තත්ත්ව දෙකෙහිදීම ඉහළ නිරි වගා කාර්ය සාධනයක් ලබාදෙන උක් ප්‍රභේද ලෙස එස් එල් 90 6237 සහ එස් එල් 93 945 සහ එස් එල් 92 4918 අතිරේක ජල සම්පාදිත තත්ත්ව යටතේ දී පමණක් ඉහළ නිරි වගා කාර්ය සාධනයක් පෙන්නුම් කරන ප්‍රභේදයක් ලෙස හඳුනා ගැනීම.

- සී සෑමේ ගැඹුර උක් බෝගයේ පැළ වගාවේ දී හා පසුව ගනු ලබන නිරි වගා වලත් අස්වනු නෙළීමේ දී ලබා ගත හැකි උක් දඬු සංඛ්‍යාව හෝ එම දඬුවල බර කෙරෙහි සැලකිය යුතු බලපෑමක් සිදු නොකරන බවත්, මධ්‍ය ප්‍රමාණයට හා ගැඹුරට සී සෑම මගින් උක් බෝගයේ මුල් අවධියේ දී නියං තත්ත්ව නිසා වන අහිතකර බලපෑම අවම කර ගැනීමට හැකිවන බවත් තහවුරු කිරීම.

ඉහළ නිරි අස්වැන්නක් ලබාදෙන එස් එල් 90 6237 නව උක් ප්‍රභේදය

- පොහොර දැමීම උක් බෝගයේ පළමු නිරි වගාවේ සිටම අස්වනු වැඩිවීම කෙරෙහි ඍජු සම්බන්ධතාවයක් පවතින බව තහවුරු කිරීම සහ අඛණ්ඩව පාළු සිටුවීම මගින් දෙවන නිරි වගාවේ සිට අස්වනු වැඩි වීමකුත් උක් ඉපනැලි කැපීම කරගෙන යාම නිසා පසු අවස්ථාවල නිරි වගා අස්වනු වැඩිවීමට ඉවහල් වන බවත් තහවුරු කිරීම.

- නිශ්චිත පරතරයකින් පැළ සිටුවීමේ තාක්ෂණය (STP) සාර්ථක මෙන්ම අඩු වියදම් ප්‍රචාරණ ක්‍රමයක් ලෙස තහවුරු කිරීම. මෙම ප්‍රචාරණ ක්‍රමය සඳහා පැළ ලබා ගැනීමට ස්ථාපිත කරනු ලබන තවාන්වල සිටුවීම සඳහා උක් අස්වනු නෙළීමෙන් අනතුරුව ක්ෂේත්‍රයේ ඉතිරිවන කරටිවලින් වෙන් කරගනු ලබන අංකුර එකක් සහිත දඬු කැබලි, මේරූ උක් දඬුවලින් ලබාගනු ලබන අංකුර එකක් සහිත කැබලි වලට වඩා යෝග්‍ය බවත්, මේ ආකාරයට සිටුවීම සඳහා වියදමකින් තොරව බීජ උක් ලබාගත හැකි බවත් පෙන්වීය.

නිශ්චිත පරතරයකින් පැළ සිටුවීමේ තාක්ෂණයේ දී බීජ පැල ලබාගන්න තවාන

සංවර්ධන

කිලිනොච්චි ප්‍රදේශයේ උක් වගාව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන දියුණු කිරීම

කිලිනොච්චියෙහි, ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයෙහි 2010 වර්ෂයෙන් පසු බාගයේ ස්ථාපිත හෙක්ටයාර 0.4ක පමණ වපසරියක ගුණනය කරන ලද එස් එල් 83 06 වර්ගයේ බීජ උක් 2011 මහ කන්නයේ වැසි ආරම්භයත් සමග කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ස්කන්ධපුරම් නැමති ගමෙහි ගොවි මහතුන්ට අයත් ඉඩම් කට්ටි හතක නැවත ගුණනය කරන ලදී. මේ යටතේ එක් එක් ගොවි මහතෙක් හෙක්ටයාර 0.4ක පමණ ඉඩම් කොටසක සිටුවා ඇති අතර, ප්‍රදේශයේ ස්ථාපිත සම්පූර්ණ බීජ උක් ගුණන වපසරිය හෙක්ටයාර 2.8ක් පමණ වේ.

කිලිනොච්චි ප්‍රදේශයේ උක් වගා බිම් සංවර්ධනය කරන ගොවි මහතුන්

සේවාවන්

පර්යේෂණ කටයුතු සඳහා

- පර්යේෂණ කටයුතු සඳහා යොදා ගැනීමට හෙක්ටයාර 32ක පමණ භූමි ප්‍රදේශයක බිම් සැකසීම.
- උණුදිය ප්‍රතිකාර කරන ලද උක් දඬු යොදා ගනිමින් එස් එල් 83 06 සහ එස් එල් 92 5588 ප්‍රභේද ගුණනය සඳහා හෙක්ටයාර 02ක පමණ බීජ උක් තවානක් ස්ථාපිත කිරීම.
- අත්තිවාරම් බීජ උක් නිපදවීම සඳහා ස්ථාපනය කරන ලද තවානෙහි සිටුවීම සඳහා අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීමට අදාළ උක් ප්‍රභේද ගුණනය කිරීම.
- උණු දිය ප්‍රතිකාර කරන ලද බීජ උක් ටොන් 80ක් පමණ තාක්ෂණ සම්ප්‍රේෂණ හා සංවර්ධන අංශයට ලබාදීම.
- ගොවිපළෙහි පර්යේෂණ ව්‍යාපෘති අවසන් කරන ලද වගාවලින් නෙළන ලද උක් දඬු ටොන් 120ක් පමණ සෙවනගල කර්මාන්තශාලාව වෙත යැවීම.
- නෙළන ලද උක් දඬු ටොන් 14ක් පමණ ආයතනයේ හකුරු නිපදවීම සඳහා ලබාදීම.
- නෙළන ලද උක් දඬු ටොන් 04ක් පමණ සිසිල් බීම නිපදවීම සඳහා ලබාදීම.
- විදුලි වැට නඩත්තු කිරීම, කම්කරුවන් අදාළ අංශ වෙත ලබාදීම හා ඒ පිළිබඳ වාර්තා තබා ගැනීම දෛනිකව කරන ලදී.

අත්තිවාරම් බීජ උක් නිෂ්පාදනය සඳහා

- නව ඉඩම් හෙක්ටයාර 03ක බිම් සැකසීම.
- හෙක්ටයාර 1.5ක ප්‍රාථමික තවානක් ස්ථාපනය කිරීම.
- යාන්ත්‍රීකරණ තාක්ෂණ අංශයේ සහයෝගයෙන් වාරි ඇල ප්‍රතිසංස්කරණය කිරීම සහ විදුලි වැට ඉදි කිරීම.
- හෙක්ටයාර 02ක ඉඩම් එළිපෙහෙළි කිරීම.

බෝග පෝෂණ අංශය

කාර්ය මණ්ඩලය:

එච්. ඒ. එස්. වීරසිංහ මහතා (විද්‍යාවේදී)	කාර්යභාර පර්යේෂණ නිලධාරි
ඒ. පී. ජේ. මොහොට්ටි මහතා	තාක්ෂණ නිලධාරි
ජී. එස්. උඩවත්ත මහතා	තාක්ෂණ නිලධාරි
පී. ඩබ්. ඩී. කුලතුංග මහතා	රසායනාගාර/ක්ෂේත්‍ර උපස්ථායක
ජේ. ගුණසිරි මහතා	රසායනාගාර/ක්ෂේත්‍ර උපස්ථායක

පර්යේෂණ විශේෂ අවස්ථා

- හිඟුරාණ උක් වගාකරන ප්‍රදේශ සඳහා පොහොර නිර්දේශය ඉදිරි වසර 03කට සංශෝධනය කිරීම.
- නව උක් ප්‍රභේද දෙකක් (එස් එල් 96 128 හා එස් එල් 96 328) පැළ වගාව නයිට්‍රජන්, පොස්ෆරස් හා පොටෑසියම්වලට ප්‍රතිචාර දක්වූ අන්දම හඳුනා ගැනීම.
- එප්පාවල ඉහළ ශ්‍රේණියේ රොක් පොස්පේට් පොහොර යෙදීමෙන් තෙවන නිරි වගාව එම පොහොරවලට ප්‍රතිචාර දක්වූ අන්දම හඳුනා ගැනීම.

විශ්ලේෂණ සේවාවන්

- උක් සාම්පල් 2437 සඳහා අවශ්‍ය රසායන විශ්ලේෂක සේවාවන් (Brix, Pol හා Fibre) ආයතනයේ අනෙකුත් අංශ හා වැඩසටහන් සඳහා සිදු කිරීම.

එස්.එල්. 96 128 හා එස්.එල්. 96 328 ප්‍රභේද පොහොර වලට දක්වන ප්‍රතිචාර හඳුනා ගැනීමේ පර්යේෂණ බිම්

බෝග ආරක්ෂණ අංශය

කාර්ය මණ්ඩලය

වී. කේ. එස්. එම්. වනසිංහ මිය (විද්‍යාවේදී)	කාර්ය භාර පර්යේෂණ නිලධාරි (2011. 09. 01 සිට)
එම්. කේ. ආර්. සිල්වා මිය (කෘෂිකර්ම විද්‍යාවේදී, විද්‍යාපති)	කාර්ය භාර පර්යේෂණ නිලධාරි (2011. 08. 31 දක්වා)
ඒ. එන්. ඩබ්. එස්. තුෂාරි මිය (විද්‍යාවේදී)	පර්යේෂණ නිලධාරි
එම්. කේ. ඩී. උබේසේන මහතා	තාක්ෂණ නිලධාරි
ආර්. ඒ. ප්‍රේමචන්ද්‍ර මහතා	තාක්ෂණ නිලධාරි (2011. 05. 18 දක්වා)
ඩබ්. එම්. එන්. එස්. කුමාරි මෙනවිය	තාක්ෂණ නිලධාරි (2011 අප්‍රේල් දක්වා)
එම්. ආර්. ප්‍රේමලාල් මහතා	විද්‍යාගාර/ක්ෂේත්‍ර උපස්ථායක
ඩී. එම්. ටී. පියරත්න මහතා	විද්‍යාගාර/ක්ෂේත්‍ර උපස්ථායක

පර්යේෂණ විශේෂ අවස්ථා

- පකිස්තානයෙන් ගෙන්වන ලද ප්‍රභේද 59ක් හා වියට්නාමයෙන් ගෙන්වන ලද ප්‍රභේද 3ක් හන්තාන ශාක නිරෝධායන මධ්‍යස්ථානයේ දී දැනට ශ්‍රී ලංකාවේ වාර්තා වී නැති රෝග හා පලිබෝධ සඳහා නිරීක්ෂණය කිරීම.
- උක් වූල් කුඩිත්තා ජෛව විද්‍යාත්මකව පාලනය කිරීමට යොදා ගන්නා ස්වාභාවික සතුරන් වන ඩයිෆා ඇපිඩිවෝරා (කෝෂ 8138) සහ මයික්‍රොමස් (කීටයින් 11,390) විද්‍යාගාර තුළ ගුණනය කර ක්ෂේත්‍රයන්ට මුදා හැරීම.
- උක් වගාවේ "මළ හදවත්" (Dead heart) තත්ත්වය ඇති කරන රෝස පැහැති ප්‍රරෝහ විදින කීටයින්ට අමතරව වෙනත් කීටයින් විශේෂයක් හඳුනා ගැනීම.
- හිඟුරාණ ප්‍රදේශයේ අලුතින් ස්ථාපනය කරන ලද උක් වගා බිම් ආශ්‍රිතව ඇතිවූ ප්‍රරෝහ විදින කීටයින්ගේ හානිය මර්දනය සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම.
- රෝග හා පලිබෝධ ඇතිවීම සම්බන්ධව ශ්‍රී ලංකාවේ සියලුම උක් වගා කරන ප්‍රදේශ ආශ්‍රිතව නිරන්තරයෙන් සමීක්ෂණ කටයුතු පවත්වාගෙන යෑම.

උක් වූල් කුඩිත්තා ජෛවවිද්‍යාත්මකව පාලනයට ඩයිපා ඇපිඩිවෝරා නැමති ස්වාභාවික සතුරා යොදා ගැනීම

යාන්ත්‍රිකරණ තාක්ෂණ අංශය

කාර්ය මණ්ඩලය

කේ. එච්. ඩී. අබේරත්න මහතා (කෘෂිකර්ම විද්‍යාවේදී)	කාර්යභාර පර්යේෂණ නිලධාරි
ඒ. එස්. එම්. ඒ. ප්‍රනාන්දු මහතා (තාක්ෂණික ඩිප්ලෝමා)	තාක්ෂණ නිලධාරි
ඩබ්. එම්. අනුරපාල මහතා	තාක්ෂණ නිලධාරි
වී. අබේගුණවර්ධන මහතා	පෑස්සුම්කරු
ජී. ආරියරත්න මහතා	වෑද්දුම්කරු
ඩබ්. ඒ. ප්‍රේමචන්ද්‍ර මහතා	කම්මල්කරු
එම්. බී. රොහාන් මහතා	විද්‍යාගාර/ක්ෂේත්‍ර උපස්ථායක
ඩී. එම්. වීරසිරි මහතා	විද්‍යාගාර/ක්ෂේත්‍ර උපස්ථායක
එච්. කේ. සුගත් නිර්ධන මහතා	පොදු කම්කරු
එස්. එච්. කුමාරසිංහ මහතා	පොදු කම්කරු
එම්. කේ. අතුල චන්දන මහතා	පොදු කම්කරු

පර්යේෂණ විශේෂ අවස්ථා

- රෝද දෙකේ ට්‍රැක්ටරයකට සවිකළ හැකි සුදු යකඩ භාවිතයෙන් පොහොර යොදන උපකරණය සාර්ථකව නිර්මාණය කර නිපදවීම.
- ඉන්දීය මාදිලියේ උක් අංකුර කැපීමේ උපකරණයක් නිර්මාණය කර නිපදවීම.

සේවාවන්

- ටයින් කල්ටිවේටර 20ක් නිපදවීම සඳහා අවශ්‍ය උපාංග සැකසීම
- 2011 වසර සඳහා කාලගුණ දත්ත එක්රැස් කිරීම
- පර්යේෂණ ගොවිපළ සහ බීජ උක් ගොවිපළ වටා විදුලි වැට සවිකිරීම
- බීජ උක් ගොවිපළ සඳහා D_4 ඇළ පුනරුත්ථාපනය කිරීම.
- පර්යේෂණ සඳහා අවශ්‍ය වෙනත් යන්ත්‍රෝපකරණ සේවා සැපයීම

නිර්මාණය කරන ලද උක් අංකුර කැපීමේ උපකරණය

සැකසුම් තාක්ෂණ අංශය

කාර්ය මණ්ඩලය

ඩබ්ලිව්. එම්. පී. වීරක්කොඩි මිය (විද්‍යාවේදී)	පර්යේෂණ නිලධාරි (2011. 10. 31 දක්වා)

පර්යේෂණ විශේෂ අවස්ථා

- වැඩි දියුණු කරන ලද ලක්ෂණ සහිත යීස්ට් දර්ශ නිෂ්පාදනය කිරීම සඳහා විවිධ ප්‍රභවවලින් යීස්ට් දර්ශ නවයක් (09) විසංගමනය කර ගැනීම හා ඒවා පවත්වා ගැනීම.
- ජෛව පොහොර නිෂ්පාදනය සඳහා පොස්පේට් ද්‍රාව්‍යය තත්ත්වයට පත් කළ හැකි බැක්ටීරියා විශේෂ හයක් (06) විසංගමනය කර ගැනීම.
- පලතුරු රසැති උක් යුෂ පානයක් නිෂ්පාදනය කිරීම සඳහා උක් යුෂ, ජලය, දෙහි යුෂ හා ඉඟුරු යුෂ යොදාගෙන වඩාත් සුදුසු ප්‍රමාණාත්මක සංකලන පහක් (05) නිර්ණය කිරීම.

ආර්ථික විද්‍යා, ජීවමිතික හා තොරතුරු තාක්ෂණ අංශය

කාර්ය මණ්ඩලය

කේ. ඒ. ඩී. කොඩිතුවක්කු මහතා (කෘෂිකර්ම විද්‍යාවේදී)	කාර්ය භාර පර්යේෂණ නිලධාරි
ආචාර්ය ඒ. පී. කීර්තිපාල මහතා (කෘෂිකර්ම විද්‍යාවේදී, දර්ශනපති, දර්ශනශූරී)	ප්‍රධාන පර්යේෂණ නිලධාරි
බී. ඩී. එස්. කේ. ආරියවංශ මිය (කෘෂිකර්ම විද්‍යාවේදී)	පර්යේෂණ නිලධාරිනී
එම්. ජී. වයි. මාධවී මෙනවිය (විද්‍යාවේදී)	තාක්ෂණ නිලධාරිනී

පර්යේෂණ විශේෂ අවස්ථා

- සෙවනගල වර්ෂාපෝෂිත සහ වාරිපෝෂිත ප්‍රදේශවල උක් වගාවේ ආදායම් වියදම් ඇගයීමට ලක් කිරීම.
- මොණරාගල හා බදුල්ල දිස්ත්‍රික්කවල උක් හකුරු නිෂ්පාදනයේ ආදායම් වියදම් ඇගයීමට ලක් කිරීම.
- පැල්වත්ත වර්ෂාපතන රටාවේ ඇති ලාක්ෂණික ගුණාංග නිර්ණය කිරීම.

විශ්ලේෂණ සේවාවන්

- බෝග වැඩිදියුණු කිරීමේ අංශය, බෝග ආරක්ෂණ අංශය හා බෝග පෝෂණ අංශය සඳහා පර්යේෂණ සැලසුම් සකස් කර දීම.
- ප්‍රාථමික අස්වනු පර්යේෂණ හා ප්‍රතිචලිත අස්වනු පර්යේෂණවල දත්ත විශ්ලේෂණ කිරීම හා බෝග ආරක්ෂණ, බෝග සම්පත් කළමනාකරණ, බෝග පෝෂණ හා යාන්ත්‍රීකරණ තාක්ෂණ අංශයන් සඳහා පර්යේෂණ දත්ත විශ්ලේෂණය කර දීම.

තොරතුරු තාක්ෂණ සේවා

- ආයතනයීය වෙබ් අඩවිය පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම.
- ආයතනය තුළ ඉ-රාජ්‍යය ප්‍රතිපත්තියට අදාළ තොරතුරු තාක්ෂණ කටයුතු ක්‍රියාවට නැංවීම
- ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව (CARP) ආයතනය මගින් ගොනු කරන ජාතික පර්යේෂණ තොරතුරු ජාලයට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා 2011 වර්ෂයට අදාළව උක් පර්යේෂණ ආයතනයේ (INFORM) පරිගණක දත්ත ගබඩාව සකස් කිරීම.
- උක් පර්යේෂණ ආයතනය තුළ ඉ-රාජ්‍යය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමට අදාළ තොරතුරු ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) වෙත ලබාදීම.

තාක්ෂණ හුවමාරු හා සංවර්ධන අංශය

කාර්ය මණ්ඩලය

එම්. එස්. පෙරේරා මහතා (කෘෂිකර්ම විද්‍යාවේදී, දර්ශනපති)	ප්‍රධාන පර්යේෂණ නිලධාරි සහ අංශ ප්‍රධානි
ඩී. පී. ඩබ්. පොත්තවෙල මහතා (කෘෂිකර්ම විද්‍යාවේදී)	තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරි
ආර්. ඒ. පී. ඒ. රණතුංග මහතා (කෘෂිකර්ම ඩිප්ලෝමා)	සංවර්ධන නිලධාරි
කේ. පී. වික්‍රමසිංහ මහතා (කෘෂිකර්ම විද්‍යාවේදී, විද්‍යාපති)	සංවර්ධන නිලධාරි
එස්. එන්. වික්‍රමසිංහ මහතා (කෘෂිකර්ම විද්‍යාවේදී)	සංවර්ධන නිලධාරි
ඩබ්. ජී. එම්. එස්. වේරගොඩ මහතා (කෘෂිකර්ම විද්‍යාවේදී)	සංවර්ධන නිලධාරි
ආර්. ඒ. ප්‍රේමචන්ද්‍ර මහතා	තාක්ෂණ නිලධාරි (2011. 06. 01 සිට)

තාක්ෂණ සම්ප්‍රේෂණ සහ සංවර්ධන කටයුතු

- **එස් එල් 83 06, එස් එල් අයි 121, එස් එල් 92 4918, එස් එල් 92 4997 සහ එස් එල් 92 5588 නව උක් ප්‍රභේද ගොවීන් අතර ප්‍රවර්ධනය කිරීම.**
  - ⋆ උක් කර්මාන්ත ප්‍රදේශයන්හි ආදර්ශන/ගුණන තවාන් වගාබිම් 16ක් ස්ථාපනය කිරීම.
  - ⋆ මූලික තවාන් ස්ථාපනය සඳහා එස් එල් 96 328 (ටොන් 07), එස් එල් 88 116 (ටොන් 02ක්) සහ එස් එල් 96 128 (ටොන් 01) ක් සෙවනගල සීනි කර්මාන්ත ආයතනයට ලබාදීම.
  - ⋆ සෙවනගල සී 07 ප්‍රදේශයේ ස්ථාපිත එස් එල් 96 328 හා දමන ප්‍රදේශයේ ස්ථාපිත එස් එල් 88 116 ප්‍රභේදයන්ගේ ආදර්ශන හා ගුණන තවාන් නඩත්තු කිරීම.
  - ⋆ සීනි කර්මාන්ත ප්‍රදේශයන්හි ආදර්ශන වැඩසටහන් 12ක් පැවැත්වීම.
  - ⋆ එස් එල් 89 1673, එස් එල් 92 4918, එස් එල් 92 4997, එස් එල් 92 5588, එස් එල් 95 4033, එස් එල් 95 4430 සහ එස් එල් 96 328 යන නව උක් ප්‍රභේද සඳහා තොරතුරු පත්‍රිකාවල මූලික පිටපත් සැකසීම.

- **උක් වගාව සඳහා උක් පර්යේෂණ ආයතනය විසින් සංවර්ධනය කර හඳුන්වාදුන් ගොවිපළ උපකරණ වන ටයින් කල්ටිවේටර් හා ඇලි සකසන උපකරණ භාවිතය ප්‍රවර්ධනය කිරීම**
  - ★ ටයින් කල්ටිවේටරය හා ඇලි සකසන උපකරණය පිළිබඳ ආදර්ශන/පුහුණු වැඩසටහන් 10ක් පැවැත්වීම.
  - ★ තම වගා බිම් තුළ භාවිත කර යෝග්‍යතාවය බැලීමට හා ඒ පිළිබඳව හුරුවීමට කැමති ගොවීන්ට අවශ්‍ය විට ලබාගැනීම සඳහා ටයින් කල්ටිවේටර් 01 බැගින් බුත්තල, සියඹලාණ්ඩුව සහ හිඟුරාණ සංවර්ධන නිලධාරී කාර්යාල තුළ තබා පහසුකම් සැපයීම.
  - ★ යාන්ත්‍රීකරණ තාක්ෂණ අංශය මගින් ටයින් කල්ටිවේටර් 20ක් හා ඇලි සකසන උපකරණ 05ක් සඳහා කොටස් නිෂ්පාදනය කිරීම.
  - ★ පැල්වත්ත ප්‍රදේශයේ ගොවි සංවිධාන සඳහා සහන මිලට ටයින් කල්ටිවේටර් 04ක් ලබාදීම.

- **උක් සමඟ අතුරු වගාවන් ලෙස පිපිඤ්ඤා, රට කජු, කව්පි, කොමඩු හා මිරිස් වගාවන් භාවිතය ප්‍රවර්ධනය කිරීම.**
  - ★ උක් සමඟ අතුරු බෝග වගා කිරීමේ ආදර්ශන 24ක් ස්ථාපනය කිරීම.
  - ★ සී 07 ප්‍රදේශයේ හෙ. 0.5ක උක් වගාව සමඟ පිපිඤ්ඤා, රට කජු හා කොමඩු අතුරු වගාවන් ලෙස යොදා ක්ෂේත්‍ර ආදර්ශනයක් ස්ථාපනය කිරීමට සෙවනගල සීනි කර්මාන්තය සමඟ සම්බන්ධීකරණය කිරීම.

උක් වගාව සමඟ පිපිඤ්ඤා අතුරු බෝගයක් ලෙස යෙදූ උක් ගොවි බිමක්

  - ★ උක් සමග අතුරු වගාවන් ආදර්ශන/පුහුණු වැඩසටහන් 10ක් පැවැත්වීම.

- **පාංශු සරුසාරභාවය කළමනාකරණය පිළිබඳ දැනුම ඉහළ නැංවීම**
  - ★ බුත්තල, සියඹලාණ්ඩුව සහ හිඟුරාණ ප්‍රදේශයන් තුළ ගොවි සමීක්ෂණයක් හා සාකච්ඡා වැඩසටහන් පැවැත්වීම.
  - ★ හිඟුරාණ ප්‍රදේශයේ ක්ෂේත්‍ර නිලධාරීන් හා ගොවීන් සඳහා නව පොහොර නිර්දේශ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
  - ★ හිඟුරාණ ප්‍රදේශයේ ගොවීන් සඳහා පොහොර භාවිතය පිළිබඳ ක්‍රම ආදර්ශනයන් පැවැත්වීම.

- **පරතරයක් ඇතිව උක් සිටුවීම ප්‍රවර්ධනය කිරීම**
  - ★ හිඟුරාණ ප්‍රදේශයේ ක්ෂේත්‍ර ආදර්ශන 03ක් ස්ථාපනය කිරීම.
  - ★ ක්ෂේත්‍ර ආදර්ශන සංස්ථාපනය සඳහා සෙවනගල සීනි කර්මාන්තායතනය හා සිවිල් ආරක්ෂක බලකාය සමඟ සම්බන්ධීකරණය කිරීම.

- ★ පරතරයක් ඇතිව උක් සිටුවීමේ ආදර්ශන/පුහුණු වැඩසටහන් 07ක් පැවැත්වීම.
- ★ පරතරයක් ඇතිව උක් සිටුවීම පිළිබඳ උපදෙස් පත්‍රිකාවක මූලික පිටපත් සැකසීම.

- **උක් වගාවේ නිර්දේශිත ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රියාකාරකම් භාවිතය ඉහළ නැංවීම**
  - ★ ගොවීන්/නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 17ක් පැවැත්වීම.
  - ★ බුත්තල ප්‍රදේශයේ හොඳින් නඩත්තු කළ උක් වගා ක්ෂේත්‍රවලට ගොවි ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කිරීම.

- **රෝග හා පලිබෝධ පාලන දැනුම ඉහළ නැංවීම**

උක් වගා ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවකට එක් වූ ගොවි මහතුන්

  - ★ උක් වගාවේ වූල් කුඩිත්තා සඳහා ජෛව විද්‍යාත්මක පාලනය පිළිබඳ ක්ෂේත්‍ර ආදර්ශන 05ක් පවත්වාගෙන යාම.
  - ★ උක් වගාවේ රෝග හා පලිබෝධ පාලනය පිළිබඳ ආදර්ශන/පුහුණු වැඩසටහන් 12ක් පැවැත්වීම.
  - ★ රෝග හා පලිබෝධ පාලනය පිළිබඳ බුලටීන් 02ක් කෙටුම්පත් කිරීම.

- **උක් හකුරු නිෂ්පාදනය වැඩි දියුණු කිරීම**
  - ★ උක් වගා කිරීම/හකුරු නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන් 03ක් පැවැත්වීම.
  - ★ සියඹලාණ්ඩුව ප්‍රදේශයේ උක් හකුරු මෝල් නවීකරණය සඳහා ණය ලබාදීමේ වැඩසටහනක් සැකසීම සඳහා ප්‍රාදේශීය බැංකු සමඟ සම්බන්ධීකරණය
  - ★ ණය වැඩසටහන යටතේ ස්ථාපිත උක් වගා බිම් ප්‍රාදේශීය බැංකු සමඟ එක්ව පරීක්ෂා කිරීම.

- උක් වගා බිම් ප්‍රවර්ධන හා ප්‍රගති සමාලෝචනය කිරීමට තෝරාගත් උක් ගොවීන් සඳහා රැස්වීම් 04ක් පැවැත්වීම.

- **ඉල්ලීම් මත පුහුණු හා සේවා සැපයීම**
  - බුත්තල පැවති දූයට කිරුළ 2011 ප්‍රදර්ශණය, ඇඹිලිපිටිය මහා විද්‍යාලයේ පැවති දින 05ක ප්‍රදර්ශණය හා වවුනියාවේ පැවති ජාතික කෘෂිකර්ම ප්‍රදර්ශණවලදී උක් පර්යේෂණ ආයතන ප්‍රදර්ශණ කුටි පවත්වාගෙන යාම.
  - කිලිනොච්චියේ ගොවීන්/නිලධාරීන්, වැල්ලවාය හමුදා කඳවුරු සාමාජිකයින් හා සියඹලාණ්ඩුවේ සිවිල් ආරක්ෂක බලකා සාමාජිකයින් සඳහා උක් වගාව පිළිබඳ පුහුණු වැඩසටහන් 03ක් පැවැත්වීම.
  - ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයේ ඩිප්ලෝමා සිසුන් 08 දෙනෙකු සඳහා උක් වගා මොඩියුලය සම්බන්ධීකරණය කිරීම.

- **මුද්‍රණ සේවා**
  - පුවත් හසුන (2011 අගෝස්තු) කලාපය නිකුත් කිරීම.
  - 2009 වාර්ෂික වාර්තාව මුද්‍රණය කිරීමට කටයුතු කිරීම.
  - සංශෝධිත උක් පර්යේෂණ ආයතනය පිළිබඳ පොත් පිංච (2011) මුද්‍රණය කිරීම.

පරිපාලන හා ගිණුම් අංශය

කාර්ය මණ්ඩලය

ආචාර්ය එන්. සී. කුමාරසිංහ මහතා (විද්‍යාවේදී, විද්‍යාපති, දර්ශනශූරි, එෆ්.ආර්.ඊ.එස්. එෆ්.අයි.බී.අයි.ඕ.එල්, එෆ්.ඒ.ඒ.එස්.එන්, වරලත් ජීව විද්‍යාඥ)	අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක
ඩී. ජී. මානාමුදලි මහතා (බී.ඒ. (ආර්ථික විද්‍යා) විශේෂ, එල්.අයි.සී.ඒ.)	නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන හා මුදල්)
ආචාර්ය ඒ. පී. කීර්තිපාල මහතා (කෘෂිකර්ම විද්‍යාවේදී, දර්ශනපති, දර්ශනශූරි)	වැ. බ. නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ හා තාක්ෂණ සම්ප්‍රේෂණ)

පාලන

ආචාර්ය සී. එපිටවල මහතා (එම්.ඒ., දර්ශනශූරි)	පරිපාලන නිලධාරී
එන්. ජී. ඒ. එල්. පී. නානායක්කාර මහතා (විද්‍යාවේදී කළමනාකරණ)	පරිපාලන නිලධාරී
ටී. ඒ. ඩී. එම්. ජී. ජයතිලක මිය	කළමනාකරණ සහකාර (ලිපිකරු සහ යතුරු ලියනය)
ජේ. කේ. චන්ද්‍රලතා මිය	කළමනාකරණ සහකාර (ලිපිකරු සහ යතුරු ලියනය)
ටී. එම්. කේ. සේනාධීර මිය	කළමනාකරණ සහකාර (ලිපිකරු සහ යතුරු ලියනය)
එම්. එම්. අයි. එම්. කේ. මැණික්කඩවර මෙනවිය	කළමනාකරණ සහකාර (ලිපිකරු සහ යතුරු ලියනය)
ජී. සෝමවීර මහතා	කළමනාකරණ සහකාර (ලිපිකරු සහ යතුරු ලියනය)
එම්. ඒ. ආර්. සමරසේකර මෙනවිය	කළමනාකරණ සහකාර (ලිපිකරු සහ යතුරු ලියනය)
ඕ. යූ. සුභසිංහ මිය	කළමනාකරණ සහකාර (ලිපිකරු සහ යතුරු ලියනය)
එස්. බී. එන්. යූ. එස්. විමලසූරිය මහතා	රියදුරු
ඔස්ටින් පෙරේරා මහතා	රියදුරු
ඒ. ඩබ්ලිව්. කේ. හෙට්ටිආරච්චි මහතා	රියදුරු
එස්. එල්. පීරිස් මහතා	රියදුරු
එච්. ඒ. යූ. එස්. පේමරත්න මහතා	රියදුරු
ජේ. පී. එස්. පී. කරුණාතිලක මහතා	රියදුරු
ටී. පී. කේ. ජයරත්න මහතා	රියදුරු
ආර්. ජී. ඩී. ඒකනායක මහතා	රියදුරු
එස්. ඒකනායක මහතා	රියදුරු

ගිණුම්

ඩී. එම්. සිරිපාල මහතා (වාණිජ විද්‍යාවේදී)	ගණකාධිකාරී
පී. එච්. යූ. නිශ්ශංක මහතා එච්.එන්.ඩී.ඒ, අයි.සී.ඒ (අන්තර් මාධ්‍ය)	සහකාර ගණකාධිකාරී
පී. එම්. අමරසිංහ මෙනවිය	පොත් තබන්නා
එල්. පී. විර්තමුල්ල මහතා	කළමනාකරණ සහකාර (ගිණුම්)
ජී. එම්. එස්. නන්දදේව මහතා	කළමනාකරණ සහකාර (ගිණුම්)
ඒ. කේ. අමරකෝන් මිය	කළමනාකරණ සහකාර (ගිණුම්)
එල්. කේ. එස්. දයානන්ද මහතා	කළමනාකරණ සහකාර (ගිණුම්)
ඩී. එම්. පී. නික්ෂන් මහතා	කළමනාකරණ සහකාර (ගිණුම්)
ටී. රංජිත් පීරිස් මහතා	කළමනාකරණ සහකාර (ලිපිකරු සහ යතුරු ලියනය)

ගබඩාව

ආර්. ජී. නිරෝෂන මහතා	ගබඩා භාරකරු
එස්. ඒ. සේනාරත්න මහතා	පොදු කම්කරු (ගබඩා)

අභ්‍යන්තර විගණන ඒකකය

එස්. පී. වයි. මුනීන්ද්‍ර මහතා අයි.සී.ඒ (අන්තර් මාධ්‍ය) එම්.ඒ.ඒ.ටී	අභ්‍යන්තර විගණක

ප්‍රසම්පාදන ඒකකය

එච්. පී. ආර්. කුමාර මහතා (ව්‍යාපාර කළමනාකරණවේදී)	ප්‍රසම්පාදන නිලධාරී

නඩත්තු ඒකකය

ආර්. පාලමුරේ මහතා	විදුලි කාර්මික
ජේ. වික්‍රමාරච්චි මහතා	පෙදරේරු/වඩු කාර්මික
ඩී. ඩබ්ලිව්. එස්. චින්තන මහතා	වඩු කාර්මික
ආර්. පී. කුලතුංග මහතා	වඩු කාර්මික
ඩී. එච්. ධර්මදාස මහතා	ජල පොම්ප ක්‍රියාකරු
එච්. පී. චන්ද්‍රවංශ මහතා	ජල පොම්ප ක්‍රියාකරු
කේ. එච්. වීරරත්න මහතා	ජල පොම්ප ක්‍රියාකරු
ආර්. එම්. ප්‍රියන්ත මහතා	පොදු කම්කරු
එම්. ඒ. ජී. රණසිංහ මහතා	පොදු කම්කරු

වර්ෂය තුළ ඉටු කරන ලද කාර්යයන්හි සාරාංශය

- ආයතනයේ සාමාන්‍ය පරිපාලන කටයුතු, පිරිස් පාලන කටයුතු සහ නඩත්තු කටයුතු මෙම වර්ෂය තුළදී ද පවත්වාගෙන යන ලදී.
- සුභසාධන කටයුතු වශයෙන් අනුමත සීමාව දක්වා වෛද්‍යාධාර මුදල් ප්‍රතිපූරණය සහ සේවකයින්ට ණය මුදල් ලබා දීම අඛණ්ඩව පවත්වාගෙන යාම.
- නියමිත පරිදි ආයතනයේ අයවැය ලේඛනය සහ මූල්‍ය ප්‍රකාශන සැකසීම, වාර්ෂික තොග සමීක්ෂණ කටයුතු සහ කළමනාකරණ තොරතුරු සැපයීම සිදු කරන ලදී.

මූල්‍ය කටයුතු පිළිබඳ සමාලෝචනය

- ආයතනයේ ප්‍රධාන ආදායම් මාර්ගය වන සෙස් ආදායම මෙම වර්ෂය තුළදී රුපියල් මිලියන 144ක් වූ අතර එය පසුගිය වර්ෂය හා සැසඳීමේ දී 0.8%ක වැඩිවීමකි.
- එසේම ආයතනයේ ආදායම හා වියදම සැසඳීමේ දී රුපියල් මිලියන 19.4ක අතිරික්තයක් වසර අවසානයේ දී පෙන්නුම් කරන ලදී.
- මෙම වසර තුළදී සිදු කරන ලද මුළු ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 4.491කි.

2011 වර්ෂය තුළ කාර්ය මණ්ඩල පිරිවැටුම

කාර්ය මණ්ඩලය ශක්තිමත් කිරීම සහ අභිප්‍රේරණය

විශ්‍රාම යෑම්

බී. කරුණාදාස මහතා	පොදු කම්කරු	2011. 01. 06
අභයරත්න විතාන මහතා	රියදුරු	2011. 02. 01
ඩබ්ලිව්. පී. එල්. චන්ද්‍රසිරි මහතා	රියදුරු	2011. 05. 31

ඉල්ලා අස්වීම්

එම්. කේ. ආර්. සිල්වා මිය	පර්යේෂණ නිලධාරී	2011. 08. 31
ඩබ්ලිව්. එම්. පී. වීරක්කොඩි මිය	පර්යේෂණ නිලධාරී	2011. 11. 02
ඩබ්ලිව්. එම්. එන්. එස්. කුමාරි මෙනවිය	තාක්ෂණ නිලධාරී	2011. 04. 11

කාර්ය මණ්ඩල පුහුණුව සහ සම්මන්ත්‍රණ සම්මේලනවලට සහභාගී වීම

ජීවමිතික සහ තොරතුරු තාක්ෂණ පර්යේෂණ නිලධාරිනී බී. ඩී. එස්. කේ. ආරියවංශ මිය 2011 මාර්තු 30 වන දින බත්තරමුල්ල පැවති විද්‍යුත් පාලන ප්‍රතිපත්ති (E-government policy) පිළිබඳ සම්මන්ත්‍රණයට සහභාගි විය.

බෝග පෝෂණ පර්යේෂණ නිලධාරී එච්. ඒ. එස්. වීරසිංහ මහතා සහ සැකසුම් තාක්ෂණ පර්යේෂණ නිලධාරී ඩබ්ලිව්. එම්. පී. වීරක්කොඩි මෙනවිය තත්ත්ව සහතික කිරීම පිළිබඳ නියාමකයන්හට සහාය වීම පිළිබඳ 2011 ජුනි 09 දින කොළඹ පැවති සම්මන්ත්‍රණයට සහභාගි විය.

සැකසුම් තාක්‍ෂණ පර්යේෂණ නිලධාරිනී ඩබ්ලිව්. එම්. පී. වීරක්කොඩි මෙනවිය ISO 2200 - 2005 ආහාර සුරක්ෂිත කළමනාකරණ ක්‍රම පිළිබඳව 2011 ජූලි 21 සහ 22 දිනයන්හිදී කොළඹ පැවති වැඩමුළුවට සහභාගි විය.

බෝග පෝෂණය පිළිබඳ පර්යේෂණ නිලධාරී එච්. ඒ. එස්. වීරසිංහ මහතා නැනෝ තාක්ෂණය සහ එහි භාවිතය පිළිබඳ 2011 සැප්තැම්බර් 30 දින කොළඹ රසායන විද්‍යා ආයතනයේ දී පැවති වැඩමුළුවට සහභාගි විය.

ශාක කායික විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ඒ. එල්. සී. ද සිල්වා මහතා ඉදිකිරීම් විශ්ලේෂණය පිළිබඳ 2011 ඔක්තෝම්බර් මස 27 සිට 29 දක්වා කොළඹ පැවති පුහුණු වැඩමුළුවට සහභාගි විය.

අධ්‍යක්ෂ ආචාර්ය එන්. සී. කුමාරසිංහ මහතා, බෝග සහ සම්පත් කළමනාකරණ අංශයේ ප්‍රධාන පර්යේෂණ නිලධාරී ආචාර්ය ඩබ්ලිව්. ආර්. ජී. විතාරම මහතා, ආර්ථික විද්‍යා, ජීවමිතික සහ තොරතුරු තාක්ෂණ අංශයේ කාර්ය භාර පර්යේෂණ නිලධාරී කේ. ඒ. ඩී. කොඩිතුවක්කු මහතා, යාන්ත්‍රීකරණ තාක්ෂණ අංශයේ කාර්ය භාර පර්යේෂණ නිලධාරී කේ. එච්. ඩී. අබේරත්න මහතා, තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරී ඩී. පී. ඩබ්ලිව්. පොත්තවෙල මහතා, ජීව තාක්ෂණ පර්යේෂණ නිලධාරිනී ඒ. එම්. එම්. එස්. පෙරේරා මෙනවිය, බෝග පෝෂණ අංශයේ කාර්ය භාර පර්යේෂණ නිලධාරී එච්. ඒ. එස්. වීරසිංහ මහතා සහ සංවර්ධන නිලධාරීන් වන ආර්. ඒ. පී. ඒ. රණතුංග, ඩබ්ලිව්. ජී. එම්. එස්. වේරගොඩ, එස්. එන්. වික්‍රමසිංහ සහ කේ. පී. වික්‍රමසිංහ මහතුන් 2011 නොවැම්බර් මස 2 වන දින කොළඹදී පැවති ව්‍යාපාරික සංවර්ධනය පුහුණු වැඩසටහනට සහභාගි විය.

ආර්ථික විද්‍යා සහ තොරතුරු තාක්ෂණ අංශයෙහි කාර්ය භාර පර්යේෂණ නිලධාරී කේ. ඒ. ඩී. කොඩිතුවක්කු මහතා චිරස්ථිති කෘෂිකර්මය, ආහාර සුරක්ෂිතතාවය සහ දුගී බව අඩු කිරීම පිළිබඳ ප්‍රතිපත්තිමය පර්යේෂණ පිළිබඳ 2011 නොවැම්බර් 14 සිට 18 දක්වා පේරාදෙණියේ දී පැවති වැඩමුළුවට සහභාගි විය.

උක් පර්යේෂණ ආයතනයේ සභාපති එස්. කේ. සිරිල් මහතා, අධ්‍යක්ෂ ආචාර්ය එන්. සී. කුමාරසිංහ මහතා, බෝග සහ සම්පත් කළමනාකරණ අංශයේ ප්‍රධාන පර්යේෂණ නිලධාරී ආචාර්ය ඩබ්ලිව්. ආර්. ජී. විතාරම මහතා 2011 නොවැම්බර් මස 21 සිට 25 දක්වා ඉන්දියාවේ නවදිල්ලි නුවර පැවති හතරවන අන්තර්ජාතික සීනි සම්මේලනයට සහභාගි විය.

අධ්‍යක්ෂ ආචාර්ය එන්. සී. කුමාරසිංහ මහතා, බෝග සහ සම්පත් කළමනාකරණ අංශයේ ප්‍රධාන පර්යේෂණ නිලධාරී ආචාර්ය ඩබ්ලිව්. ආර්. ජී. විතාරම මහතා, ජල කළමනාකරණය පිළිබඳ පර්යේෂණ නිලධාරී එල්. එම්. ජේ. ආර්. විජේවර්ධන මහතා ශ්‍රී ලංකාවේ විද්‍යාඥයන්ගේ දැනුම බෙදා ගැනීම තුළින් සවිබල ගැන්වීම පිළිබඳ 2011 දෙසැම්බර් 13 සිට 15 දක්වා කොළඹ දී පැවති වැඩසටහනට සහභාගි විය.

ජල කළමනාකරණය පිළිබඳ පර්යේෂණ නිලධාරී එල්. එම්. ජේ. ආර්. විජේවර්ධන මහතා ගෝලීය තොරතුරු/තාක්ෂණ ක්‍රම (GIS) පිළිබඳ 2011 නොවැම්බර් 21 සිට 26 දක්වා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පැවති කෙටි, පාඨමාලාවකට සහභාගි විය.

බෝග පෝෂණ අංශයෙහි කාර්ය භාර පර්යේෂණ නිලධාරී එච්. ඒ. එස්. වීරසිංහ මහතා 2011 දෙසැම්බර් 19 දින මහනුවර පැවති ක්ෂුද්‍රජීවී ජීව පොහොර භාවිතය පිළිබඳ සම්මන්ත්‍රණයකට සහභාගි විය.

අභ්‍යන්තර විගණක එස්. පී. වයි. මුනින්ද්‍ර මහතා සහ ගබඩා භාරකරු ආර්. ජී. එස්. නිරෝෂන් මහතා 2011 දෙසැම්බර් 23 සිට 25 දක්වා කොළඹ දී පැවති ස්ථාවර වත්කම් කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහනට සහභාගි විය.

ජීවමිතික සහ තොරතුරු තාක්ෂණ පර්යේෂණ නිලධාරිනී බී. ඩී. එස්. කේ. ආරියවංශ මිය සංඛ්‍යාන විද්‍යාත්මක පර්යේෂණ පිළිබඳව 2011 දෙසැම්බර් මස 26 සහ 27 දිනයන්හි දී කොළඹ පැවති වැඩමුළුවකට සහභාගි විය.

ජීවමිතික සහ තොරතුරු තාක්ෂණ පර්යේෂණ නිලධාරිනී බී. ඩී. එස්. කේ. ආරියවංශ මිය නවීන ලෝකය සඳහා තාක්ෂණ විද්‍යාත්මක සංකල්ප සහ ක්‍රම පිළිබඳව 2011 දෙසැම්බර් 28 සිට 30 දක්වා කොළඹ දී පැවති අන්තර්ජාතික ශ්‍රී ලංකා සංඛ්‍යා විද්‍යාත්මක සම්මේලනයට සහභාගි විය.

ප්‍රකාශන

i. ද සිල්වා ඒ. එල්. සී., ද කොස්තා ඩබ්. ඒ. ජේ. එම්. සහ බණ්ඩාර ඩී. එම්. යූ. එස්. (2011), ශ්‍රී ලංකාවේ ජල සම්පාදන සහ වාරිපෝෂිත තත්ත්වයන් යටතේ දී උක් මූල පද්ධතියේ වර්ධනය සහ පාංශු තෙතමනය උපයෝජනය කර ගැනීමේ රටාවන්, ෂුගර් ටෙක්. කාණ්ඩය 13 (3), පිටු අංක 198 - 205.

ii. ද සිල්වා ඒ. එල්. සී. (2011) උප ආර්ද්‍රව දේශගුණික තත්ත්වයන්හිදී උක් බෝගයේ කායික විද්‍යාත්මක හැසිරීම. ලැප් ලැම්බර්ඩ් ශාස්ත්‍රය ප්‍රකාශක

iii. ද සිල්වා ඒ. එල්. සී. සහ විතාරම ඩබ්. ආර්. ජී. (2011), පරතරයක් සහිතව උක් පැල සිටුවීමේ තාක්ෂණයේ දී රෝපන ද්‍රව්‍යයක් ලෙස උක් කරටිවල ඇති ප්‍රයෝජනය. කෘෂිකර්මය සහ පරිසරය මත පදනම්ව පැවැත්වූ අන්තර්ජාතික ශාස්ත්‍රීය සම්මන්ත්‍රණයේ කාර්ය වාර්තාව. 2011. කෘෂිකර්ම පීඨය, රුහුණු විශ්ව විද්‍යාලය, මාපලාන, කඹුරුපිටිය, ශ්‍රී ලංකා. පිටුව 20.

iv. කුමාරසිංහ එන්. සී. සහ විජයවර්ධන එල්. එම්. ජේ. ආර්. (2011). ශ්‍රී ලංකාවේ උක් වගාවට දේශගුණික තත්ත්වය බලපෑම, කෘෂිකර්මය මත දේශගුණය වෙනස්වීම බලපෑම මත පවත්වන ලද අන්තර්ජාතික සම්මන්ත්‍රණයේ ශාස්ත්‍රීය වාර්තාව. කෘෂිකර්ම පීඨය, රුහුණු විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව.

v. කුමාරසිංහ එන්. සී. (2011) ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්තයේ අතීතය. වර්තමානය සහ අනාගතය. ලංකා වැවිලිකරුවන්ගේ සංගමයේ 75 වන සංවත්සරය පිළිබඳ ප්‍රකාශනය 70-75.

vi. වීරසිංහ එච්. ඒ. එස්. (2011) ශ්‍රී ලංකාවේ උක් වගා කරන පස්වල පොටෑසියම් තත්ත්වය පොටෑසියම්වල ක්‍රියාකාරිත්වය තුළින් තිරසාර ලෙස අස්වැන්න හා එහි ගුණාත්මය අධ්‍යයනය කිරීමට පැවැත්වූ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ වාර්තා සටහන. සංවිධානය, ජාත්‍යන්තර පොටෑෂ් ආයතනය (ස්විට්සර්ලන්තය), ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය හා ශ්‍රී ලංකා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව. මහනුවර, ශ්‍රී ලංකාව

vii. වීරසිංහ එච්. ඒ. එස්., කීර්තිපාල, ඒ. පී. හා සිවනන්තවල්. ටී. (2011), ශ්‍රී ලංකාවේ හිඟුරාණ උක් වගාකරන ප්‍රදේශවල වගාවන් වෙනස් වීම නිසා පස්වල රසායන සංයුතිය පිළිබඳ විශේෂිත අධ්‍යයනය, නැගෙනහිර හා දකුණු නැගෙනහිර ආසියාතික රටවල පාංශු විද්‍යාව පිළිබඳ සංවිධාන වල එකතුවේ දහවන ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ වාර්තා සටහන. කොළඹ, ශ්‍රී ලංකාව.

viii. විජයවර්ධන එල්. එම්. ජේ. ආර්., අබේරත්න කේ. එච්. ඩී., විතාරම ඩබ්. ආර්. ජී. සහ කීර්තිපාල ඒ. පී. (2011). ශ්‍රී ලංකාවේ සෙවනගල වර්ෂාපෝෂිත උක් වගාවේ අතිරේක ජල සම්පාදනය සඳහා, මතුපිට ආපදාව මගින් අපතේ යන ජලය රැස්කර ගැනීම සහ කෘෂි ලිං භාවිතයඃ මූලික සොයා බැලීමක්. 16 වන අන්තර්ජාතික වනාන්තර සහ පාරිසරික සම්මන්ත්‍රණය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය ශ්‍රී ලංකාව.

විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

සභාපතිතුමා,
උක් පර්යේෂණ ආයතනය,
උඩවලව.

විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව - 2011

2011 වර්ෂයේ දී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පෙර වර්ෂයට සාපේක්ෂව සැසඳීමේදී (03) රැස්වීම් වාර 05ක් පැවැත්වීමට හැකි විය.

මෙම වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින්ගේ කැපවීම මත රජය විසින් අනුමත කර ඇති අණ පනත් හා චක්‍රලේඛවලට අවධානය යොමු කරමින් ආයතනයේ පැවති ගැටලුවලට විසඳුම් ලබාදීමට හැකිවීමත් ආයතනයේ කටයුතු කරගෙන යාමේ දී මතුවන විවිධ පරිපාලන ගැටලුවලට විසඳුම් සෙවීමේ දී බාහිර ආයතනවලින් සිදු කර ගත යුතු කරුණු සම්බන්ධයෙන් කමිටු සාමාජිකයින්ගේ මැදිහත්වීම මත අවශ්‍ය සහාය ලබා දීමට විගණන හා කළමනාකරණ කමිටුවට හැකිවී ඇත.

තීන්දු තීරණ ගැනීම සඳහා පාලක මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු කරුණු ඊට ප්‍රථම විගණන හා කළමනාකරණ කමිටුවේ දී සාකච්ඡා කර අවස්ථානුකූලව අවශ්‍ය පරිදි නිර්දේශ කිරීම තුළින් පාලන මණ්ඩලයට තීරණ ගැනීම පහසු කිරීම සඳහා විගණන හා කළමනාකරණ කමිටුවේ සහාය නොපිරිහෙලා ඉටු කර ඇත.

ආයතනයේ ස්ථාපිත කර ඇති පාලන පද්ධතීන් වල ඇති දුර්වලතාවයන් හා වැරදි අඩුපාඩු තුළින් සිදුවන බලපෑම අවම කර ගැනීමටත් ඒ තුළින් බාහිර විගණකවරුන්ගෙන් ලැබිය හැකි විගණන විමසුම් අවම කර ගැනීමට විගණන හා කළමනාකරණ කමිටුවේ ක්‍රියාකාරීත්වය හේතු වී ඇත.

මේ අනුව ආයතනයේ වැඩ කටයුතු සාර්ථකව කරගෙන යාමට 2011 වර්ෂයේ දී උක් පර්යේෂණ ආයතනීය විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාකර ඇත.

අභ්‍යන්තර විගණක
2012 ඔක්තෝබර් මස 16 වන දින.

විගණනය කළ මූල්‍ය ප්‍රකාශන

උක් පර්යේෂණ ආයතනය

2011 දෙසැම්බර් 31 දිනට මූල්‍යම තත්ත්ව ප්‍රකාශනය

වත්කම්	සටහන්	2011 රු.	2011 රු.	2010 රු.	2010 රු.
ජංගම නොවන වත්කම්					
දේපල හා යන්ත්‍රෝපකරණ	1	71,690,896.00		88,755,317.00	
ආයෝජන (දිගු කාලීන)	2	30,020,313.00	101,711,209.00	29,500,113.00	118,255,430.00
ජංගම වත්කම්					
පාරිභෝගික තොගය	3	4,510,833.00		5,352,815.00	
නොනිමි වැඩ		100.000.00	717,521.00		
වෙළෙඳ සහ අනිකුත් ලැබිය යුතු ආදායම් (කෙටි කාලීන)	4	38,844,369.00		46,915,647.00	
ආයෝජන (කෙටි කාලීන)	5	114,418,248.00		197,434,957.00	
කලින් ගෙවීම් සහ වෙනත් තැන්පතු	6	655,514.00		842,381.00	
මුදල් හා මුදල් සමාන දෑ	7	68,749,990.00	227,278,954.00	16,901,137.00	268,164,458.00
මුළු වත්කම්			**328,990,163.00**		**386,419,888.00**
වගකීම්					
ජංගම වගකීම්					
